# විගණන සේවා කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව

# 2016


අංක 35 ඒ,

ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත,

කොළඹ 08.

දුරකථන : 0112-674659 /0112674660
ෆැක්ස් : 0112-674657
ඊ මේල් : secretaryasc@sltnet.lk
ascoffice@sltnet.lk

## දැක්ම

මහජන බැඳියාව සහ වගවීම සඳහා කැප වූ

විශිෂ්ට විගණන සේවයක්

## මෙහෙවර

වෘත්තීයමය භාවය, නිපුණත්වය සහ යහපාලනය පෙරදැරි කර ගත් රාජ්‍ය

විගණන සේවයක් ස්ථාපනය කිරීම තුළින් රාජ්‍ය සම්පත් වලට වගවීම

සහතික කිරීම

## අපගේ අගයන්

- ස්වාධීනත්වය
- අපක්ෂපාතීත්වය
- අවංක භාවය
- නවෝත්පාදනය
- පාරදෘශ්‍යභාවය
- වගවීම
- වෘත්තීය නිපුණත්වය

# විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

## සභාපති

එච්.එම්. ගාමිණී විජේසිංහ මහතා

## සාමාජිකයින්

විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මහතා

අයි. ගාමිණී අබේරත්න මහතා

වී. කන්දසාමි මහතා

ඩබ්ලිව්.ඒ. සෝමපාල පෙරේරා මහතා

# පෙලගැස්ම



| අනු අංකය | කාරණය | පිටුව |
|---|---|---|
| **1.** | හැඳින්වීම | 1 |
| **2.** | විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් | 1-3 |
| **3.** | විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධනය-2016 | 3-6 |
| 3.1 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල හා කර්තව්‍යන්හි ප්‍රගතිය | 3 |
| 3.2 | කොමිෂන් සභාව විසින් ඉටු කරන ලද අනිකුත් කර්තව්‍යන් | 4 |
| 3.3 | පරිපාලන සහ මූල්‍ය කටයුතු | 4-6 |
| **4.** | කාර්ය මණ්ඩලය | 6-8 |
| 4.1 | සංවිධාන සටහන | 6 |
| 4.2 | කාර්ය මණ්ඩල සංයුතිය | 6-8 |
| **5.** | කොමිෂන් සභා රැස්වීම් | 8 |
| **6.** | ස්තුතිය | 8-9 |
| **7.** | ඇමුණුම් | |
| | 1. නීතිපතිවරයා විමසා ඇති ලිපිය | 10-11 |
| | 2. නීතිපතිවරයාගේ පිළිතුරු ලිපිය | 12-13 |
| | 3. අමාත්‍ය මණ්ඩල තීරණය | 14-17 |
| | 4. 2016.01.01 සිට 2016.12.31 දක්වා මූල්‍ය වාර්තාව | 18 |
| | 5. විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන | 19 |

# විගණන සේවා කොමිෂන් සභාව

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII වන පරිච්ඡේදයේ 153 අ (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 අ (1) ව්‍යවස්ථාව අනුව විගණන සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුතු විගණකාධිපතිවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්ද කොමිෂන් සභාව සමන්විත වන්නේය.

අ. නියෝජ්‍ය විගණකාධිපති හෝ ඊට ඉහළ ධුරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ලත් නිලධරයන් දෙදෙනෙකු

ආ. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ,අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාම ලත් විනිශ්චයකාරවරයකු

ඇ. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාම ලත් I වන පන්තියේ නිලධරයකු

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඌ අනු ව්‍යවස්ථාව අනුව විගණන සේවා කොමිෂන් සභාව විසින් සෑම ලිත් වර්ෂයකදී ම පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වන්නේය. ඒ අනුව 2016 වර්ෂය වෙනුවෙන් මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

## 2. විගණන සේවා කොමිෂන් සභාවේ බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ (1) ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයින් පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමේ බලය විගණන සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

ඊට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ (2) (අ) ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත්

සාමාජිකයින්ගේ සේවයට බඳවා ගැනීමේ පටිපාටි, පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමට අදාළ රීති සකස් කිරීමේ බලයද කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

තවද නීතිය මඟින් ස්ථාපිත ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම සහ නීතිය මඟින් සලකනු ලබන පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීමේ බලය ද විගණන සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අන්තර් කාලීන විධිවිධාන සඳහන් 49 (5) වගන්තිය අනුව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක දිනට පෙරාතුව දිනයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයින්ගේ, පත්කිරීම්, උසස් කිරීම් මාරු කිරීම් හා විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම පිළිබඳ සියලු කරුණු එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විගණන සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර ඒ අනුව විගණන සේවා කොමිෂන් සභාව ඒවා සම්බන්ධයෙන් තීරණය කරනු ලැබිය යුතු වන්නේය.

එහෙත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ආ (2) ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කර නොතිබුණු බැවින් කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නීතිපතිවරයාගෙන් විමසීමක් කරන ලදි. ( නීතිපතිවරයා විමසා ඇති ලිපිය - ඇමුණුම 1)

නීතිපතිවරයාගේ 2016 ජනවාරි 04 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කරන තුරු ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන්ට අදාළ ආයතනික කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ක්‍රියාත්මක කල යුතු බවට දැනුම් දී ඇත. (නීතිපතිවරයාගේ පිළිතුරු ලිපිය - ඇමුණුම 2)

තවද 2016 ජනවාරි 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන්, ඉදිරියේදී ස්ථාපිත කිරීමට නියමිත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන

සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන තෙක් ශ්‍රී ලංකා විගණන සේවයේ සහ විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන්ට අදාළ ආයතන කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියා කල යුතු බව දැනුම් දී ඇත. (අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය - ඇමුණුම 3)

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවාවක් ස්ථාපිත නොවීම තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් විගණන සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල හා කර්තව්‍යයන් පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට මේ දක්වා නොහැකි වී ඇත.

## 3. විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධනය - 2016

### *3.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ඇ ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල හා කර්තව්‍යන්හි ප්‍රගතිය*

| බලතල | ප්‍රගතිය |
|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයින්ගේ,<br>➢ පත්කිරිම<br>➢ උසස් කිරිම<br>➢ මාරු කිරිම<br>➢ විනය පාලනය<br>➢ සේවයෙන් පහ කිරීම | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කර නොමැති බැවින් මෙම කාර්යයන් ඉටු කර නැත. |
| ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් නිලධරයන්ගේ සේවයට බඳවා ගැනීම් පටිපාටි, පත්කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීමට අදාළ රීති සකස් කිරීම. | ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත වූ පසු අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් නිලධාරීන් බඳවා ගැනීමට හා ඊට අනුසාංගික වූ කරුණු වලට අදාළ විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පරිච්ඡේද 11ක් කෙටුම්පත් කිරීම. |
| ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම. | ජාතික විගණන කාර්යාලය ස්ථාපිත කිරීමට අදාළ විධි විධාන ඇතුළත් ජාතික විගණන පනත පාර්ලිමේන්තුවේ සම්මත වී නොමැති බැවින් අදාළ කාර්යයන් ඉටු කර නැත. |

### *3.2 කොමිෂන් සභාව විසින් ඉටු කරන ලද අනිකුත් කර්තව්‍යයන්*

(අ) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ලක ස්ථාපිත කරනු ලැබුවා වූ විගණන සේවා කොමිෂන් සභාව සඳහා නව කාර්යාලයක් 2016 අප්‍රේල් මාසය වන විට අංක 35 ඒ, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත, කොළඹ 08 යන ස්ථානයේ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

(ආ) විගණන සේවා කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍යයන් පූර්ණ ලෙසට ක්‍රියා කළ හැක්කේ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීමෙන් අනතුරුව බැවින් හා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීමට අදාළ ප්‍රතිපාදන යෝජිත ජාතික විගණන පනතේ සඳහන්ව ඇති බැවින් ජාතික විගණන පනතේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් විගණන සේවා කොමිෂන් සභාව විසින් අධ්‍යනය කර එම පනත සඳහා කල යුතු සංශෝධන පිළිබඳව කොමිෂන් සභාවේ නිරීක්ෂණ විගණකාධිපති වෙත දන්වා යවන ලදි.

(ඇ) ජාතික විගණන පනත් කෙටුම්පතේ අඩංගු කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම සඳහා පත් කරන ලද අමාත්‍ය මණ්ඩල අනුකමිටුවට ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ නිරීක්ෂණ විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශයේ ලේකම් වෙත යැවීමට කටයුතු කරන ලදි.

### *3.3 පරිපාලන සහ මූල්‍ය කටයුතු*

(අ) විගණන සේවා කොමිෂන් සභාවේ එදිනෙදා කාර්යයන් ඉටු කිරීම සඳහා පාලන සහ ගිණුම් ලෙස අංශ 2ක් ස්ථාපිත කර ඇත.

***පාලන අංශය***

සමස්ත පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය හා තොරතුරු කළමනාකරණ සම්බන්ධ කාර්යභාරය පාලන අංශය විසින් මෙහෙයවනු ලබයි.

***ගිණුම් අංශය***

මූල්‍ය කටයුතු හා ස්ථාවර වත්කම් වාර්තා කිරීමට අදාළ සියලු කටයුතු මෙම අංශය විසින් ඉටු කරනු ලබයි.

(ආ) 2016 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 29 ක් සහ ඉතිරි රුපියල් මිලියන 6.5 ක් ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 35.5 ක් මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇත.

(ඈ) 2016 වර්ෂයේ විගණන සේවා කොමිෂන් සභාවේ ප්‍රතිපාදන, වියදම් සහ ඉතිරිය පිළිබඳව සාරාංශය පහත පරිදි වේ. (සම්පූර්ණ මූල්‍ය වාර්තාව ඇමුණුම 4)

| | ප්‍රතිපාදන රු. | වියදම් රු. | ඉතිරිය රු. |
|---|---|---|---|
| පුනරාවර්තන | 29,000,000 | 26,934,065 | 2,065,935 |
| ප්‍රාග්ධන | 6,500,000 | 6,072,392 | 427,608 |
| එකතුව | 35,500,000 | 33,006,457 | 2,493,543 |

**විගණන සේවා කොමිෂන් සභාවේ වියදම් (2016 වර්ෂය)**










(ඇ) කොමිෂන් සභාවට ලැබෙන ලිපි හා ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ග ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කර ඇත.

(ඉ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් වැඩසටහන් යටතේ නිලධාරීන් අට දෙනෙකු පුහුණු සඳහා යොමු කර ඇත.

| | පුහුණු වැඩසටහනේ නම | තනතුර | නිලධාරීන් ගණන |
|---|---|---|---|
| 1 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය ඉලක්ක කරගත් දෙදින වැඩමුළුව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| 2 | ගිණුම් පොත්පත් ක්‍රමානුකූලව නඩත්තු කිරීම | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 3 | කාර්යාල කාර්ය සහයකයින්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල දැමීම | කාර්යාල කාර්ය සහයක | 02 |
| 4 | රියදුරු මහතුන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල දැමීම | රියදුරු | 02 |
| 5 | ලේඛක කටයුතු පිළිබඳ පුහුණුව | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |

(ඊ) කොමිෂන් සභාව සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට අදාළ මූලික කටයුතු සකසා ඇත.

## 4. කාර්ය මණ්ඩලය

### *4.1 සංවිධාන සටහන*

විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන ඇමුණුම 5 න් දක්වා ඇත.

### *4.2 කාර්ය මණ්ඩල සංයුතිය*

2016 වර්ෂය තුල විගණන සේවා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 43කින් සමන්විත විය. කෙසේ වුවද පවත්නා කාර්යයන් පිළිබඳ සැලකිල්ලට ගෙන එම කාර්ය මණ්ඩලයට 21 දෙනෙකු අනුයුක්ත කර ගැනීමට කටයුතු කරන ලදී. එම කාර්ය මණ්ඩලය පිළිබඳ සංයුතිය පහත දක්වා ඇත.

**විගණන සේවා කොමිෂන් සභාවේ අනුමත හා දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු පිළිබඳ තොරතුරු (2016.12.31) දිනට**

| තනතුරේ ස්වභාවය | තනතුර | සේවය | ශ්‍රේණිය/ පන්තිය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම් | | | 01 | 01 | 0 |
| | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප. සේවය | විශේෂ | 01 | 0 | 01 |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප. සේවය | I | 01 | 0 | 01 |
| | අධ්‍යක්ෂ | දීප ව්‍යාප්ත සේවා | I | 01 | 0 | 01 |
| | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප. සේවය | III /II | 02 | 0 | 02 |
| | සහකාර අධ්‍යක්ෂ | දීප ව්‍යාප්ත සේවා | III /II | 01 | 0 | 01 |
| | විගණන අධිකාරි | ශ්‍රී.ලං.වි. සේවය | III /II | 01 | 0 | 01 |
| | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග. සේවය | III /II | 01 | 01 | 0 |
| | නීති නිලධාරි | දෙපාර්තමේන්තු ගත | III /II | 01 | 0 | 01 |
| | එකතුව | | | 10 | 02 | 08 |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරි | රා.ක.ස සේවය | අධි පන්තිය | 01 | 01 | 0 |
| | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | II/ I | 03 | 0 | 03 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | ශ්‍රී.ලං.තො හා සන්. තා සේවය | 2 පන්තිය II/ I | 01 | 01 | 0 |
| | එකතුව | | | 05 | 02 | 03 |
| ද්විතීය මට්ටම | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො හා සන්. තා සේවය | 3 පන්තිය III /II/ I | 01 | 0 | 01 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස. සේවය | III /II/ I | 15 | 07 | 08 |
| | එකතුව | | | 16 | 07 | 09 |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | රියදුරු සේවය | III | 06 | 05 | 01 |
| | කාර්යාල කාර්ය සහයක | කාර්යාල සේවක සේවය | III | 06 | 05 | 01 |
| | එකතුව | | | 12 | 10 | 02 |
| එකතුව | | | | 43 | 21 | 22 |




## 5. කොමිෂන් සභා රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුල කොමිෂන් සභා රැස්වීම් 16 ක් පවත්වා ඇත.

## 6. ස්තුතිය

සමාලෝචිත වර්ෂය තුල විගණන සේවා කොමිෂන් සභාවේ කාර්යයන් ඉටුකිරීම සඳහා ලබා දුන් ජනාධිපති කාර්යාලය, පාර්ලිමේන්තු මහ ලේකම් තුමා, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, විගණකාධිපති දෙපාර්තමේන්තුව හා විගණන සේවා කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයට කොමිෂන් සභාවේ කෘතවේදීත්වය පල කරනු කැමැත්තෙමු.

| | | |
|---|---|---|
| එච්.එම්.ගාමිණී විජේසිංහ මහතා | සභාපති |  |
| විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මහතා | සාමාජික |  |
| අයි. ගාමිණී අබේරත්න මහතා | සාමාජික |  |
| වී. කන්දසාමි මහතා | සාමාජික |  |
| ඩබ්ලිව්.ඒ. සෝමපාල පෙරේරා මහතා | සාමාජික |  |

ඇමුණුම - 01

ASC/1/2015

29 December 2015

Hon. Attorney General
Attorney General's Department

**LEGAL ISSUES IN CONNECTION WITH THE POWERS VESTED IN THE AUDIT SERVICE COMMISSION**

The Audit Service Commission which is constituted under Article 153(A) of the Nineteenth Amendment to the Constitution of the Democratic Socialist Republic of Sri Lanka Commenced its function from 23 November 2015 after appointing its members by H.E the President.
According to Article 153(c) (1) of the Nineteenth Amendment to the Constitution, the powers of appointment, promotion, transfer, disciplinary control and dismissal of the members belonging to Sri Lanka State Audit Service is vested in the Audit Service Commission.

After passing the Nineteenth Amendment to the Constitution by the Parliament and Certified on 15 May 2015 the matters relating to appointment, promotion, transfer, disciplinary control and dismissal of the officers of the Sri Lanka Audit Service and Sri Lanka Audit Examiners Service have not been attended by the Public Service Commission as advised the Attorney General by his letter dated 25 May 2015.

According to Article 49 (5) of the Nineteenth Amendment to the Constitution all matters relating to the appointment, promotion, transfers, disciplinary control and dismissal of the members of the Sri Lanka State Audit Service and pending before the Public Service Commission on the day preceding the date on which this Act comes into operation shall be transferred to the Audit Service Commission and shall be determined by the Audit Service Commission.

The Cabinet of Ministers had decided as a matter of policy on 23/12/2014 to establish the Sri Lanka State Audit Service and to absorb officers of Sri Lanka Audit Service and Sri Lanka Audit Examiners Service into proposed new Service. but the National Audit Act incorporating the establishment of Sri Lanka State Audit Service has not been passed in the Parliament.

The Sri Lanka State Audit Service referred in the Nineteenth Amendment to the Constitution has not been defined or its Composition Stated. In the absence of such definition question arises whether Audit Service Commission newly constituted could exercise powers of the appointment, promotion, transfer, disciplinary control and dismissal of the officers of the Sri Lanka Audit Service and Sri Lanka Audit Examiners Service.

On such situation the Audit Service Commission directed me to obtain your opinion and views as to know whether Audit Service Commission could act in relation to the appointment, promotion, transfer, disciplinary control and dismissal of the officers belonging to the Sri Lanka Audit Service and Sri Lanka Audit Examiners Service until the State Audit Service established.

Since the matters relating to appointment, promotion, transfer, disciplinary control and dismissal matters related to officers in Sri Lanka Audit Service and Sri Lanka Audit Examiners Service are pending. I shall be thankful if you give advice as to know whether the Audit Service Commission could exercise its powers till the National Audit Act passed or alternative arrangement as an interim measure.

I enclosed the following documents for your convenience.

(i) Draft National Audit Act
(ii) Copy of the Cabinet decision dated 23/12/2014
(iii) Copy of the letter sent to you by the Public Service Commission and your reply dated 25 May 2015
(iv) Cabinet decision dated 10 June 2015

Your early response is highly appreciated.

M.W Kanthi Gunathilake
Secretary
Audit Service Commission

ඇමුණුම - 02

මගේ අංකය / எனது இல. / My No. AG/61/2015

ඔබේ අංකය / உமது இல. / Your No. ASC/1/2015

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2147888, 2433967, 2433769, 2320800, 2327919

ඉලෙක්ට්‍රොනික් තැපැල / மின்-அஞ்சல் / E-mail administration@attorneygeneral.gov.lk

ෆැක්ස් / தொலைநகல் / Fax 2436421

නීතිපති දෙපාර්තමේන්තුව
சட்டமா அதிபர் திணைக்களம்
ATTORNEY - GENERAL'S DEPARTMENT

තැ. පෙ. අංකය / அஞ்சல் பெட்டி / P.O. Box No. 502

කොළඹ 12.
கொழும்பு 12
Colombo 12.

04[th] January, 2016

විගණන සේවා කොමිෂන් සභාව 04 JAN 2016

Ms. M. W. Kanthi Gunathilake,
Secretary,
Audit Service Commission,
306/72, Polduwa Road,
Battaramulla.

LEGAL ISSUES IN CONNECTION WITH THE POWERS VESTED IN THE AUDIT SERVICE COMMISSION

I refer to your letter dated 29 December 2015, requesting an opinion on whether the Audit Service Commission could exercise powers relating to the appointment, promotion, transfer, disciplinary control and dismissal (hereinafter collectively referred to as "powers") of the officers of the Sri Lanka Audit Service and Sri Lanka Audit Examiners Service and the subsequent correspondence and discussions.

In terms of the 19th Amendment to the Constitution, the Audit Service Commission has powers over the members of the Sri Lanka State Audit Service. The Sri Lanka State Audit Service is a new service that has been proposed, and the Cabinet has taken a policy decision on 23 December 2014 to establish such a new service. However, as at present, the Sri Lanka State Audit Service has not been established. In any event, in terms of Article 153B(2) of the Constitution, Parliament has to provide by law for the establishment of the Sri Lanka State Audit Service.

As indicated to the Public Services Commission by our letter dated 25 May 2015, à copy of which has been forwarded by you along with your letter under reference, the Public Service Commission cannot exercise any powers over members of the Sri Lanka State Audit Service and it would have to transfer all matters relating to the Sri Lanka State Audit Service pending before it to the Audit Service Commission. However, until the establishment of the Sri Lanka State Audit Service, it is the Public Services Commission that would have to exercise powers over the officers of the Sri Lanka Audit Service and Sri Lanka Audit Examiners Service. It would have been helpful had the Cabinet been apprised of the distinction between the Sri Lanka Audit Service and Sri Lanka State Audit Service.

In the above circumstances, it would be necessary to apprise the Cabinet of the contents of this letter prior to taking any further steps in this regard.

Nirmalan Wigneswaran
Senior State Counsel

Sgd./ Y.J.W. Wijayatilake, P.C.
Attorney General

අමුණුම - 03

රහසිගතයි

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION    අමාත්‍ය මණ්ඩල තීරණය    அமைச்சரவைத் தீர்மானம்

පිටපත් : නීතිපතිතුමා.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් ලේකම්.
රාජ්‍ය පරිපාලන හා කළ.ලේකම්.
විගණකාධිපති.

මගේ අංකය: අමප/15/0852/634/003-I
2016 පෙබරවාරි මස 04 දින.

ක්‍රියා කළ යුතු : ජනාධිපති ලේකම්.
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.
විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

**19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්ථාපිත කරන ලද විගණන සේවා කොමිෂන් සභාව මඟින් ශ්‍රී ලංකා විගණන සේවයේ සහ ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරින්ට අදාළ ආයතන කටයුතු**

(අමාත්‍ය මණ්ඩලයේ ලේකම් අමතන ලද විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2016-01-05 දිනැති ලිපිය)

2016 ජනවාරි මස 27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

**(ඇ) පරිපූරක න්‍යාය පත්‍රයේ විෂයයන්:**

48. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 16/0146/755/001 වශයෙන් අංකගත කෙරුණු, බුද්ධශාසන අමාත්‍ය හා අධිකරණ අමාත්‍ය සහ ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සභාපතිතුමා ඉදිරිපත් කළ 2016-01-26 දිනැති සටහනට යා කොට තිබූ, 2016-01-26 දින පැවැත්වුණු ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ නිර්දේශ නවයක් (09) ඇතුළත් අංක 01 දරන වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලදුව, එකී නිර්දේශවල ඇතුළත් පහත සඳහන් නිර්දේශය අනුමත කරන ලදී.

48.09 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 15/0852/634/003-I වශයෙන් අංකගත කරන ලද, "**19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්ථාපිත කරන ලද විගණන සේවා කොමිෂන් සභාව මඟින් ශ්‍රී ලංකා විගණන සේවයේ සහ ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරින්ට අදාළ ආයතන කටයුතු**" සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ ලේකම් අමතන ලද විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2016-01-05 දිනැති ලිපිය - අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ පහත සඳහන් නිර්දේශය සඳහා අනුමැතිය දෙන ලදී:

→ 2

මෙම තීරණය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් කරුණාකර 2325279 හෝ 2329621

- 2 -

"ඉහත ලිපිය, පහත සඳහන් ලේඛන සමඟ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් සලකා බලන ලදී:

(I) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් "දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීම" යන මැයෙන් නීතිපතිතුමා අමතන ලද 2015-05-21 දිනැති ලිපිය;

(II) ඉහත (I) හි සඳහන් ලිපියට පිළිතුරු වශයෙන් නීතිපතිතුමා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යවන ලද 2015-05-25 දිනැති ලිපිය;

(III) දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි, ජාතික පොලිස් කොමිෂන් සභාව සහ විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කරනු ලබන තෙක්, පොලිස් නිලධාරීන්ට හා ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරීන්ට අදාළ ආයතන කටයුතු අමාත්‍ය මණ්ඩලය විසින් සිදු කළ යුතු බවට වන අමප අංක 15/0852/634/003 හා 2015-06-10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය;

(IV) විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් "විගණන සේවා කොමිෂන් සභාවට පැවරී ඇති බලතල සම්බන්ධයෙන් වන නීතිමය ගැටලු" යන මැයෙන් නීතිපතිතුමා අමතන ලද 2015-12-29 දිනැති ලිපිය;

(V) ඉහත (IV) හි සඳහන් ලිපියට පිළිතුරු වශයෙන් නීතිපතිතුමා විසින් විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කරනු ලැබ ඇති 2016-01-04 දිනැති ලිපිය; සහ

(VI) දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරිදි, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවාව ස්ථාපිත කොට වර්තමාන කාර්ය මණ්ඩලය ඊට අන්තර්ග්‍රහණය කරනු ලබන තෙක්, ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරීන්ට හා ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන්ට අදාළ ආයතන කටයුතු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියා කළ යුතු බව දැනුම් දෙමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කර ඇති නීතිපතිතුමාගේ 2016-01-25 දිනැති ලිපිය.

→ 3

- 3 -

මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරන ලදී:

(අ) ඉහත (II) හි සඳහන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද නීතිපතිතුමාගේ උපදෙස් අදාළ වන්නේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරිදි ඉදිරියේදී ස්ථාපිත කිරීමට නියමිත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ නිලධාරින් සම්බන්ධයෙන් විනා, දැනට සේවයේ නියුතු ශ්‍රී ලංකා විගණන සේවයේ හා ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරින් සම්බන්ධයෙන් නොවන බවට වන පැහැදිලි කිරීමක් නීතිපතිතුමාගේ 2016-01-25 දිනැති ලිපිය මගින් දැන් ලබා දී ඇති බව;

(ආ) ඉහත (VI) හි සඳහන්, නීතිපතිතුමාගේ ලිපියේ සඳහන් උපදෙස් අනුව, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කරනු ලබන තෙක් ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරින්ට සහ ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරින්ට අදාළ ආයතන කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉටු කළ යුතු බව; සහ

(ඇ) ඉහත (III) හි සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරින්ට හා ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරින්ට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබ ඇති තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ලබාගැනීම යෝග්‍ය බව;

මේ පිළිබඳව වැඩිදුරටත් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඉල්ලා සිටීම අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට තීරණය කරන ලදී:

(i) ඉහත (III) හි සඳහන් අමප අංක 15/0852/634/003 හා 2015-06-10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා විගණන සේවයේ නිලධාරින්ට හා ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරින්ට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබ ඇති තීරණ සම්බන්ධයෙන් එකඟතාව ලබා දීම; සහ

→ 4

- 4 -

(ii) ශ්‍රී ලංකා විගණන සේවයේ හා ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ නිලධාරීන්, ඉදිරියේදී ස්ථාපිත කිරීමට නියමිත ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන තෙක් එකී සේවාවන්වල නිලධාරීන්ට අදාළ ආයතන කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යෝග්‍ය පරිදි ක්‍රියා කිරීම".

තවද, මෙම තීරණය සම්මත කරනු ලැබූ සේ සැලකීමටත්, ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත මෙම තීරණය දන්වා යැවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට බලය පැවරීමටත් තීරණය කරන ලදී.

ක්‍රියා කළයුතු: **ජනාධිපති ලේකම්** - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්**
**විගණන සේවා කොමිෂන් සභාවේ ලේකම්**

පිටපත්: **නීතිපතිතුමා**
**අග්‍රාමාත්‍ය ලේකම්** - අදාළ ලියවිලිවල පිටපත බැගින් යා කොට ඇත.
**මුදල් අමාත්‍යාංශය**
**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**
**විගණකාධිපති**

ඇමුණුම 04

විගණන සේවා කොමිෂන් සභාව

**මුළු ප්‍රතිපාදන සහ වියදම 2016 -01 -01 දින සිට 2016-12-31 දින දක්වා**

| වැය විෂය | විස්තරය | වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීම - 2016 රු. | අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම - 2016 රු. | මු.රෙ. 66 මාරු කිරීම 2016 රු. | අනුමත මුළු ප්‍රතිපාදන වෙන් කිරීම - 2016 රු. | වියදම 2016-01-01 සිට 2016-09-30 දක්වා රු. |
|---|---|---|---|---|---|---|
| **21-01-01-02-1405** | ***පුනරාවර්තන වියදම්*** | **29,000,000.00** | **-** | **-** | **29,000,000.00** | **26,934,065.51** |
| | **පුද්ගල පඩි නඩි** | | | | | |
| 1001 | වැටුප් හා වේතන | | | | | 3,589,464.56 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | | | | | 84,277.14 |
| 1003 | වෙනත් දීමනා | | | | | 7,913,636.33 |
| | **ගමන් වියදම්** | | | | | |
| 1101 | දේශීය | | | | | 5,646.00 |
| | **සැපයුම්** | | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය වියදම් | | | | | 1,004,665.52 |
| 1202 | ඉන්ධන සැපයීම් | | | | | 1,555,381.53 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | | | | | 96,096.29 |
| | **නඩත්තු වියදම්** | | | | | |
| 1301 | වාහන නඩත්තු වියදම් | | | | | 306,013.10 |
| | **සේවා** | | | | | |
| 1402 | තැපැල් හා සංනිවේදන වියදම් | | | | | 788,730.58 |
| 1403 | විදුලිය හා ජල වියදම් | | | | | 266,973.98 |
| 1404 | බදු කුලී හා දේශීය බදු | | | | | 9,437,500.00 |
| 1405 | වෙනත් වියදම් | | | | | 1,677,350.94 |
| | **මාරු කිරීම** | | | | | |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | | | | | 208,329.54 |
| **21-01-01-02-2501** | ***ප්‍රාග්ධන වියදම්*** | **6,500,000.00** | **-** | **-** | **6,500,000.00** | **6,072,391.69** |
| | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි** | | | | | |
| | **දියුණු කිරීම** | | | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | | | | 31,319.00 |
| 2003 | වාහන | | | | | 56,000.00 |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | | | | | 5,905,947.69 |
| | **මානව සම්පත් සංවර්ධනය** | | | | | |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | | | | | 79,125.00 |
| | **මුළු එකතුව** | **35,500,000.00** | **-** | **-** | **35,500,000.00** | **33,006,457.20** |

ඇමුණුම 05


විගණන සේවා කොමිෂන් සභාවේ සංවිධාන සටහන
කොමිෂන් සභාව
ලේකම්
අතිරේක ලේකම්
අධ්‍යක්ෂ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
විගණන අධිකාරී
සහකාර අධ්‍යක්ෂ
නීති නිලධාරී
ගණකාධිකාරී
සහකාර ලේකම්
සහකාර ලේකම්
භාෂා පරිවර්තක
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
පරිපාලන නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
රාජ්‍ය කළමනාකරණ සහකාර
අනෙකුත් කාර්ය මණ්ඩලය
(කාර්යාල කාර්ය සහායක/රියදුරු)